

# සංක්‍රමණිකයකුගේ සටහන

## අප්‍රේල්

අප්‍රේල් හෙවත් බක් මාසය සංස්කෘතිකමය වශයෙන් ගත්තත් දේශපාලනිකමය වශයෙන් ගත්තත් අපේ ජීවිත වලට අතිශයින් වැදගත් මාසයක්. අවුරුදු මාසය අපි කාටත් සුපුරුදු කාලයක්. එක් හැම වසරකම යළි යළිත් අලුත් වෙන මතකයක්. ඒත් මේ බක් මාසය බොහෝ දෙනෙකුට අමතක, එහෙත් අමතක නොකල යුතු තරුණ නැගිටීමක ඇරඹුම සුදුවුණ කාලයක්. 71 අප්‍රේල් නැගිටීම අරගලය ගැන අපි මතක් කල යුත්තේ එය ඔබේත් මගේත් පමණක් නොව මුළු ශ්‍රී ලාංකික දේශපාලන ඉතිහාසයම මැලුමනින් ම කනපිට ගැසූ නිසා ය. ලංකාවේ මෙන්ම විදේශ වලත් බුද්ධිමතුන් විචාරකයන් 71 අරගලය ගැන විවිධ අදහස් පල කොට ඇතත් මේ විග්‍රහයන් පක්ෂ වූයේ බොහෝ විට අරගලයට නොව අරගලය විසින් අභියෝගයට ලක් කරන ලද බලවේගයන් වලටය. එහෙයින් බොහෝ විට මේ කරුණායන් ඔවුනට විටෙක කැරලිකරුවන් ද විටෙක ත්‍රස්තවාදීන් ද තවත් විටෙක චේ ගුවේරා කාරයින් ද වූහ. එසේම තවත් කොටසකට මොවුන් දේශප්‍රේමීන් ද , විප්ලවවාදීන් ද වීරයන් ද වූ හ.

එහෙත් මැදහත් සිතින් තක්සේරු කරන කවරෙකුට වුව ද අප්‍රේල් අරගලය යනු නොමේරූ තරුණ කැරැල්ලක් සේ දැකීම අසීරු ය. එය එක් අතකින් නිදහසින් පසු දිගු කලක් සමාජය පෙලූ දේශීය ධනපති පංතියේ අධිපත්‍යයෙන් මිදීමට දැරූ ප්‍රයත්නයකි. අනෙක් අතින් එතෙක් ශ්‍රී ලාංකීය ජන සමාජය වෙලාගෙන සිටි ගතානුගතික පසුගාමී සමාජ ආකල්ප වලට මුහුණට මුහුණ ලා කල අභියෝගයකි. දශක හතරකට ආසන්න කාලයක් පුරා දැවැන්ත මර්ධනයන්ට මුහුණ දී අලු දූවිලි බවට පත් වී ඒ දැවුණ දූවිලි මතින් යලි ඉපදෙමින් අඛන්ඩ ගමනක ඉදිරියට යමින් ජනතා ගෞරවයට ලක්වෙමින්, විශ්වාසනීයත්වයේ හා අවංකත්වයේ ප්‍රතිමූර්තියක් බවට පත් වෙමින් තිබෙන්නේ ඒ අප්‍රේල් අරගලයේ ප්‍රතිඵලයන් ලෙස නොවේ ද?

සැබැවින් ම අප්‍රේල් අරගලය යනු නැවුම් සිහිනයක උපතකි.

## පොදුරාජ්‍ය ක්‍රීඩා

මනස අන්දමන්ද කර ඇස් නිලංකාර කරන නවීන විද්‍යුත් මාධ්‍ය තාක්ෂණ හරඹයන් විසින් හැඩ වැඩ දමා ඔපවත් කරන ලද පොදුරාජ්‍ය මන්ඩල ක්‍රීඩා උළෙල කියන්නේ ගිලිහී ගිය බ්‍රිතාන්‍ය කිරීටයේ අභිමානය හා ආදිපත්‍යය රඳවා තබා ගැනීම සඳහා කරනු ලබන නව යටත් විජිතවාදී උපක්‍රමයක් ය කියල මා කිව්වොත් හුග දෙනෙක් හිනා වේවි. ඔබ සිනාසුනත් ඒක තමයි නොපෙනෙන සත්‍යය. ඒක අපිට දැනෙන්නෙ නැහැ. දැනෙන්න දෙන්නෙත් නැහැ. ඉතිං මේ උළෙල ගැන මොනව ලියන්නද. මල්වෙඩියි චින්තක ගැනයි ඇරුනාම. ආපු 100 කන්ඩායම ගැනත්, පාර්ලිමේන්තු කටයුතු අධ්‍යයනය කිරීමේ මුවාවෙන් ජනතා මුදලින් උළෙලට පැමිනි මන්ත්‍රී හොර නඩය ගැනත් කතා නොකර ඉමු. චින්තක මල්ලි ඔබ අපට ආඩම්බරයක්. නිසි පහසුකම් නැතිව ඔබ ආ ගමන විශිෂ්ඨයි. ඔබට දැං බොහෝ දේ ලැබී ඇති. නැති අයට ලැබෙන එක හොඳයි. ඒත් ඒ ලැබීම ම තමන්ගෙත් රටේත් අභාග්‍යයට හේතුවක් නොවේවා කියලා පතනවා. එහෙම කිව්වෙ අතීත අද්දැකීම් නිසයි. අපට හිටපු අනගි සම්පතක් අද අපට අහිමි වෙලා තියෙන්නේ පමනට වඩා බොහෝ දේ ලැබුන නිසා. ලංකාවේ අයටත් කියන්නේ මුදල් ක්‍රීඩකයෙකුට අවශ්‍ය බව ඇත්ත. ඒත් වඩාත් අවශ්‍ය වන්නේ නිසි මග ලෙන්වීමක්. චින්තකට ඒ දේ ලබාදෙන්න ක්‍රීඩා අමාත්‍යාංශයට හැකි වේවා යි පතනවා.

## පලාත් සභා

ශ්‍රී ලංකා රජයේ වියදමින් සිව් වසරකට වරක් මහත්වරුන්ට මෙන්ම හොරුන්ට, තක්කඩියන්ට, දූෂිතයන්ට, චන්ඩින්ට රැකියා ලබා දීමේ මහා ව්‍යාපෘතිය පොදු ජන පෙරමුනට විශිෂ්ඨ ප්‍රතිඵල ගෙන දෙමින් අවසන් වුනා. මැතිවරන කාලෙදි ඉරිතැලුන මහින්ද චින්තනය දැන් අවසන් ගමන් යන්නට කාලය එළඹිලා ඉවරයි. රටේ හා ගමේ බලය ලැබුන පසු මොන චින්තන ද?

ඉතිහාසය අපට බොහෝ පාඩම් උගන්වා තිබෙනවා. තනි පුද්ගලයෙකුට හො පක්ෂයකට අසීමිත බලයක් ලැබීමේ ප්‍රතිඵල ගැන. මහින්දගේ බලය පිළිබඳව අපට ප්‍රායෝගික දැනුමක් මේ මාසයේ දි ම බලාගත හැකියි.

එස්බී ත් ඡන්දෙට ආවෙම නැහැ. මහින්ද විජේසේකරත් දොට්ට. මේ පෙලගැසෙමින් තිබෙන්නේ කුමක්ද? මුස්ලිම් කොන්ග්‍රසයත්, ද්‍රවිඩ කොන්ග්‍රසයත් ලඟදීම ආන්ඩුවේ කොටස් කරුවන් වේවි. මේ ප්‍රාදේශීය සභා චන්දය ලංකාවේ දේශපාලනයේ තීරනාත්මක එකක් වේවි ද?

## සන්නස

සන්නසට අවුරුද්දයි. පත්තර දැවැන්තයන් අතර කජු කිරි කොල්ලන්ගේ පත්තරේ ජයග්‍රාහීව ඉදිරියට යනවා. කෙම්ටියක් ධනය නැති උනත් නැපවීමත් අධිෂ්ඨානයත් ඇත්නම් අරමුණකට ලඟාවිය හැකියි. ජගත් ඇතුලු සන්නසේ පිරිවරට සංක්‍රමණිකයාගේ සුභ පැතුම්. හැඩ වැඩ වී දැනුමෙන් පෝෂණය වී ජනතාවට හිස් දෙයක් නොව හොඳ දෙයක් ලබා දිමේ ගෞරවය ඔබ සතුයි.

සන්නස.... ඔබට ජය.





